(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 6]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2008 ජුලි මස 08 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0012/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග සහ ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා විස්ස සහ ඒවා එකිනෙකෙහි දිග කොපමණද;

(ii) එම ගංගා ආරම්භවන ස්ථාන සහ අවසන් වන ස්ථාන කවරේද;

(iii) එම ගංගා කවර දිස්ත්‍රික්ක හරහා ගලා යන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙකී ගංගා මගින් ආර්ථිකය ගොඩනැඟීම උදෙසා ආරම්භ කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් කවරේද;

(ii) වේලි බැඳීම මගින් බලශක්තිය උත්පාදනය කිරීමේ හැකියාව සංවර්ධනය කර තිබේද හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද; සහ

(iv) නොඑසේ නම්, ඒවායේ ප්‍රයෝජනය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0013/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ ක්‍රියාත්මකව පවතින රූපවාහිනී මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) බලපත්‍ර නිකුත් කර ඇතත්, මෙහෙයුම් ආරම්භ කර නොමැති රූපවාහිනී මධ්‍යස්ථාන සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම රූපවාහිනී මධ්‍යස්ථානවල විකාශය කිරීමේ සංඛ්‍යාතය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දේශීය චිත්‍රපට කර්මාන්තයට සහාය ලබාදෙන චේතනාවෙන් රට තුළට විදේශ රූපවාහිනී චිත්‍රපට ගලා ඒම අධෛර්යමත් කරනු සඳහා රජය විසින් බදු හඳුන්වා දී ඇති

බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එමඟින් අපේක්ෂිත අභිමතාර්ථය සැපිරී තිබේද;

(ii) එසේ නම්, මෙවැනි ප්‍රතිලාභ ලබාගෙන ඇති ස්ථාන සහ ආකාර කවරේද;

(iii) බද්ද පැනවූ දින පටන් අද දක්වා එකිනෙක රූපවාහිනී මධ්‍යස්ථානය විසින් මාසිකව ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) (i) මෙම රූපවාහිනී මධ්‍යස්ථානවලට පනවා ඇති අනෙකුත් බදු කවරේද;

(ii) රජය විසින් ඉකුත් මාස 12ක කාලය තුළ උපයාගත් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0014/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 13 වැනි පාර්ලිමේන්තුව තේරී පත්වූ පසු ආනයනය කරන ලද වෙඩි නොවදින වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) මිල, රක්ෂණය හා ගැල්කුලිය හා තීරුබදු සඳහා ගෙවූ මුළු මුදල කොපමණද;

(iii) නොඑසේ නම්, තීරු බදු වලින් නිදහස් කරන ලද වටිනාකම කොපමණද;

(iv) මෙම මෝටර් රථ වෙන් කරන ලද්දේ කාටද;

(v) දැනට මෙම මෝටර් රථ ලබාදී ඇත්තේ කාහටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම මෝටර් රථ ආනයනය කරන ලද්දේ ටෙන්ඩර් කැඳවීමෙන් පසුවද;

(ii) ඒවා ආනයනය කරන ලද්දේ කුමන රටකින්ද;

(iii) මුදල් ගෙවන ලද්දේ කාහටද;

(iv) මුදල් වෙන් කරන ලද වැය ශීර්ෂය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0192/'08

4.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතිය ගොඩනැඟීමේ එක් එක් කැබිනට් නොවන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශ නිල කාර්යාලය ස්ථාපිත කර ඇත්තේ රජයේ ගොඩනැගිල්ලක ද යන්න ජාතිය ගොඩනැඟීමේ එක් එක් කැබිනට් නොවන අමාත්‍යතුමාට අදාළව වෙන් වෙන්

වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික ආයතනයක හෝ පුද්ගලයෙකු සතු ඉඩමක හෝ ගොඩනැගිල්ලක අදාළ කාර්යාලය ස්ථාපිතකර තිබේ නම්, එම ස්ථානයේ ලිපිනය, අයිතිකරුගේ ලිපිනය සහ ලබාගත් දිනය කවරේද;

(ii) කුලියට, බද්දට හෝ වෙනත් කවර හෝ පදනමකින් කාර්යාලයට අවශ්‍ය ඉඩකඩ ලබාගෙන ඇත්නම්, එහි වර්ග අඩි ප්‍රමාණය, ඒ සඳහා මාසිකව හා වාර්ෂිකව වැයකරන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) කුලියට, බද්දට හෝ වෙනත් කවර හෝ පදනමකින් කාර්යාලයට හා අවශ්‍ය ඉඩකඩ ලබාගැනීම සඳහා තැන්පත් මුදලක් ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) රජයේ ගොඩනැගිල්ලක අදාළ කාර්යාලය ස්ථාපිත කිරීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0193/'08

5.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ආගමික කටයුතු පිළිබඳ (කැබිනට් නොවන) අමාත්‍යතුමාගේ අමාත්‍යාංශ නිල කාර්යාලය ස්ථාපිත කර ඇත්තේ රජයේ ගොඩනැගිල්ලක ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික ආයතනයක හෝ පුද්ගලයෙකු සතු ඉඩමක හෝ ගොඩනැගිල්ලක අදාළ කාර්යාලය ස්ථාපිතකර තිබේ නම්, එම ස්ථානයේ ලිපිනය, අයිතිකරුගේ ලිපිනය සහ ලබාගත් දිනය කවරේද;

(ii) කුලියට, බද්දට හෝ වෙනත් කවර හෝ පදනමකින් කාර්යාලයට අවශ්‍ය ඉඩකඩ ලබාගෙන ඇත්නම්, එහි වර්ග අඩි ප්‍රමාණය, ඒ සඳහා මාසිකව හා වාර්ෂිකව වැයකරන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) කුලියට, බද්දට හෝ වෙනත් කවර හෝ පදනමකින් කාර්යාලයට හා අවශ්‍ය ඉඩකඩ ලබාගැනීම සඳහා තැන්පත් මුදලක් ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) රජයේ ගොඩනැගිල්ලක අදාළ කාර්යාලය ස්ථාපිත කිරීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0194/'08

6.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ඛනිජතෙල් හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඛනිජතෙල් සම්පත් (කැබිනට් නොවන) අමාත්‍යතුමාගේ අමාත්‍යාංශ නිල කාර්යාලය ස්ථාපිත කර ඇත්තේ රජයේ ගොඩනැගිල්ලක ද යන්න එතුමා මෙම සභාවට

දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික ආයතනයක හෝ පුද්ගලයෙකු සතු ඉඩමක හෝ ගොඩනැගිල්ලක අදාළ කාර්යාලය ස්ථාපිතකර තිබේ නම්, එම ස්ථානයේ ලිපිනය, අයිතිකරුගේ ලිපිනය සහ ලබාගත් දිනය කවරේද;

(ii) කුලියට, බද්දට හෝ වෙනත් කවර හෝ පදනමකින් කාර්යාලයට අවශ්‍ය ඉඩකඩ ලබාගෙන ඇත්නම්, එහි වර්ග අඩි ප්‍රමාණය, ඒ සඳහා මාසිකව හා වාර්ෂිකව වැයකරන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) කුලියට, බද්දට හෝ වෙනත් කවර හෝ පදනමකින් කාර්යාලයට හා අවශ්‍ය ඉඩකඩ ලබාගැනීම සඳහා තැන්පත් මුදලක් ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) රජයේ ගොඩනැගිල්ලක අදාළ කාර්යාලය ස්ථාපිත කිරීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0321/'08

7.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමාට නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එකී නිවස පළාත් සභාවට හෝ මධ්‍යම රජයට අයත්වේද;

(iii) නොඑසේ නම්, එය කුලී පදනම මත ලබාගත් නිවසක්ද; සහ

(iv) එම නිවසේ අයිතිකරු හා මාසික කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ ප්‍රධාන අමාත්‍යතුමාට ලබා දී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවල අංක හා වර්ගය කවරේද;

(iii) ඒවා පළාත් සභාවට අයත් වාහනද;

(iv) නොඑසේ නම්, එම වාහනවල අයිතිකරුගේ නම හා මාසික කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ ප්‍රධාන අමාත්‍යාංශයට අනුයුක්ත වාහන සංඛ්‍යාව, ඒවායේ අංක හා වර්ගය කවරේද;

(ii) එම වාහන ලබාදී තිබෙන නිලධාරීන් කවුරුන්ද;

(iii) එම වාහන පළාත් සභාවට අයත් ද නැතහොත් කුලී පදනම මත ලබාගත්තේද;

(iv) එසේ නම්, ඒවායේ අයිතිකරුවන් හා මාසික කුලිය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0322/'08

8.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යතුමාට නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එකී නිවස පළාත් සභාවට හෝ මධ්‍යම රජයට අයත්වේද;

(iii) නොඑසේ නම්, එය කුලී පදනම මත ලබාගත් නිවසක්ද; සහ

(iv) එම නිවසේ අයිතිකරු හා මාසික කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ අමාත්‍යතුමාට ලබා දී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවල අංක හා වර්ගය කවරේද;

(iii) ඒවා පළාත් සභාවට අයත් වාහනද;

(iv) නොඑසේ නම්, එම වාහනවල අයිතිකරුගේ නම හා මාසික කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත වාහන සංඛ්‍යාව, ඒවායේ අංක හා වර්ගය කවරේද;

(ii) එම වාහන ලබාදී තිබෙන නිලධාරීන් කවුරුන්ද;

(iii) එම වාහන පළාත් සභාවට අයත් ද නැතහොත් කුලී පදනම මත ලබාගත්තේද;

(iv) එසේ නම්, ඒවායේ අයිතිකරුවන් හා මාසික කුලිය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0323/'08

9.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහවැලි "බී" කලාපයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් බෙදීම සඳහා 2003 වර්ෂයේ ඉඩම් කච්චේරියක් පැවැත්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඉඩම් බෙදාදීම සඳහා ඉඩම් කච්චේරිය පැවැත්වීම අධිකරණ නියෝගයක් මත වාරණයකට ලක්කළ බවත්;

(ii) එසේ තිබියදී, දේශපාලන හිතවත්කම් මත වාණිජ පදනමින් ඉඩම් බෙදාදී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) 2005 - 2006 වර්ෂ තුළ මෙම ප්‍රදේශයේ වාණිජ ඉඩම් ලබාගත් අයගේ නාම ලේඛනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0382/’08

10.

ගරු අචල ජාගොඩගේ මහතා, — විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අදාළ අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති විද්‍යා සම්පත් මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවන ලද දිනයන් සහ පිහිටුවා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද,

(iii) දැනට ක්‍රියාත්මක සහ ක්‍රියාත්මක නොවන මධ්‍යස්ථාන සංඛ්‍යාව වෙන් වෙන්ව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහි ද?

(ආ) (i) ඉහත විද්‍යා මධ්‍යස්ථානවල සේවය සඳහා බඳවා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) එම තනතුරු වලට බඳවාගත් දිනයන් සහ අදාළ වැටුප කොපමණද;

(iii) ඔවුන්ගේ තනතුරු ස්ථිර කිරීමට පියවර ගන්නේද;

(iv) එසේනම් ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0383/’08

11.

ගරු අචල ජාගොඩගේ මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ එතුමාගේ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

1.

නියෝජ්‍ය කථානායක සහ කාරක සභා සභාපති ඡන්දයෙන් තෝරා පත් කිරීම.

[අංක 6 (2) දරන ස්ථාවර නියෝගය]

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

2.

වාරිමාර්ග සහ ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා,— සිවිල් ගුවන් සේවාව විධිමත් කිරීම පාලනය කිරීම සහ සම්බන්ධිත කාරණා සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම; අන්තර් ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතිය බලාත්මක කිරීම; සහ ඊට සම්බන්ධ වූ හා ඊට ආනුෂංගික වූ කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේ දී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ.භා. 4.30 දක්වා විය යුතු ය. අ.භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— උපදේශක කාරක සභා සහ ස්ථාවර කාරක සභා (ව්‍යවස්ථාදායක),—

(අ) මතු දැක්වෙන පරිදි උපදේශක කාරක සභා පනස් පහක් (55) පත්කළ යුතු ය.

පිළිවෙළින්:—

1. ආගමික කටයුතු හා සදාචාර වර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
2. රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ උපදේශක කාරක සභාව,
3. මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
4. ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
5. අභ්‍යන්තර පරිපාලන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
6. වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
7. අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,

8. සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
9. වරාය හා ගුවන් සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
10. ඛනිජ තෙල් හා ඛනිජ සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
11. මහාමාර්ග හා මාර්ග සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
12. කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
13. අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
14. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
15. තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
16. තැපැල් හා විදුලි සංදේශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
17. නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
18. සමාජ සේවා හා සමාජ සුභසාධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
19. නිවාස හා පොදු පහසුකම් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
20. ප්‍රජා සංවර්ධන හා සමාජ විෂමතා දුරලීමේ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
21. ජල සම්පාදන හා ජලාපවහන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
22. විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
23. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
24. නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
25. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
26. අතිරේක වැවිලි භෝග සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
27. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
28. අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
29. විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
30. ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
31. ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
32. ජනතා වතු කළමනාකරණ හා සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
33. ඉඩම් හා ඉඩම් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
34. තරුණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
35. ජනමාධ්‍ය හා තොරතුරු පිළිබඳ උපදේශක කාරක සභාව,
36. දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
37. කම්කරු සබඳතා හා මිනිස් බල කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
38. ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
39. වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
40. ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ උපදේශක කාරක සභාව,
41. ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා පිළිබඳ උපදේශක කාරක සභාව,
42. සංචාරක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
43. විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
44. වෘත්තීය හා කාර්මික පුහුණු කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
45. ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,

46. පළාත් පාලන හා පළාත් සභා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
47. ධීවර හා ජලජ සම්පත් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
48. පශු සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
49. විදේශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
50. සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ උපදේශක කාරක සභාව,
51. උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
52. වාරිමාර්ග හා ජල කලමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
53. කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
54. ප්‍රවාහන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,
55. පරිසර සහ ස්වභාවික සම්පත් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව,

අංක 109 දරන ස්ථාවර නියෝගය අනුව කාරක සභාව වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වාර්තා කිරීම සඳහා එක් එක් උපදේශක කාරක සභාව පස් දෙනෙකුට (05) නොඅඩු සහ තිස් එක් දෙනෙකුට (31) නොවැඩි මන්ත්‍රීවරුන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

එක් එක් උපදේශක කාරක සභාවක ගණපූරණය සඳහා මන්ත්‍රීන් තිදෙනෙකු (03) අවශ්‍ය විය යුතු ය.

(ආ) පිළිවෙළින් "ඒ" ස්ථාවර කාරක සභාව සහ "බී" ස්ථාවර කාරක සභාව යනුවෙන් හැඳින්විය යුතු ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභා දෙකක් පත් කළ යුතු ය.

එක් එක් කාරක සභාවක් මන්ත්‍රීන් තිස්එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු අතර, යම්කිසි විශේෂිත පනත් කෙටුම්පතක් සලකා බැලීම පිණිස අතිරේක වශයෙන් මන්ත්‍රීන් පහළොවකට (15) නොවැඩි ගණනක් එක් කාරක සභාවකට පත් කිරීමට කථානායකතුමාට බලය තිබිය යුතු ය.

එක් එක් ස්ථාවර කාරක සභාවක ගණපූරණය සඳහා මන්ත්‍රීන් හත් දෙනෙකු (07) අවශ්‍ය විය යුතු ය.

6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ගෘහ්‍ය කාරක සභාව,— ස්ථාවර නියෝග 122 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, ගෘහ්‍ය කාරක සභාව, කථානායකතුමා සභාපති වූ ද, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් මන්ත්‍රීවරුන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

7.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 123 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, කථානායකතුමා සභාපති වූ ද, නියෝජ්‍ය කථානායකතුමා, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් මන්ත්‍රීවරුන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

8.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 124 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, කථානායකතුමා සභාපති වූ ද, නියෝජ්‍ය කථානායකතුමා, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා, පාර්ලිමේන්තුවේ සභානායකතුමා, විපක්ෂනායකතුමා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් මන්ත්‍රීවරුන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

9.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 125 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

10.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 126 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

11.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— වරප්‍රසාද පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 127 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

12.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 128 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

13.

ගරු පියසිරි විජේනායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය,—

" අමාත්‍යාංශ, පළාත් සභා, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය සමාගම්, රජයට අයත් ව්‍යාපාරික ආයතන සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීම සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි. "

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2008 ජුලි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,—යුද හමුදා පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු (357 වැනි අධිකාරය වූ) යුද හමුදා පනතේ 155 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදනු ලැබ, අංක 1543/18 දරන 2008 අප්‍රේල් මස 01 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.05.06 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් නිෂ්පාදන බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 මාර්තු මස 14 වැනි දින අංක 1540/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*4.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 වැනි දින අංක 1544/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*5.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත පනත යටතේ නියෝගය (අංක 1),— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 24ඇ(2) වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් ආදායම් බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ නියෝගය (අංක 2),— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 23(1) (ඇ) වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් ආදායම් බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*7.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ නියෝගය (අංක 3),— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 212 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් ආදායම් බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*8.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2002 අංක 11 දරන මුදල් පනතේ 2 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*9.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් මුද්දර ගාස්තු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*10.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආර්ථික සේවා ගාස්තු පනත යටතේ නියෝගය,— 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 12 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් ආර්ථික සේවා ගාස්තු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 22 වැනි දින අංක 1546/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*11.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 26 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 26 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 25002 "වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා වූ අත්තිකාරම් ගිණුම" රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දරන කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 53,00,000 සිට<br>රු. 49,00,000 දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ | සංශෝධන නොමැත |

උපරිම සීමාව

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.02.22 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*12.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 35 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 35 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 " රජයේ කර්මාන්ත ශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම" රජයේ කර්මාන්ත ශාලාව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 140,000,000 සිට<br>රු. 275,000,000 දක්වා | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*13.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන

අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 36 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 36 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 " රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම" රජයේ කර්මාන්ත ශාලාව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 4,50,00,000 සිට<br>රු. 13,50,00,000 දක්වා | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*14.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 38 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 38 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 01602 "අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිසම — අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුම " දරන කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 30,00,000 සිට<br>රු. 65,00,000 දක්වා | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 8,00,000 සිට<br>රු. 20,00,000 දක්වා | |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි | | සංශෝධන |

| | | |
|---|---|---|
| | නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | නොමැත |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.04.30 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*15.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා ,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 13 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 13 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 23202 "බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම" බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 6,50,00,000 සිට<br>රු. 7,50,00,000 දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 6,60,00,000 සිට<br>රු. 7,60,00,000 දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 3,00,00,000 සිට<br>රු. 3,10,00,000 දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.05.05 වැනි දින,

කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*16.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 39 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 39 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවන, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 21302 “පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය ” අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,30,00,00,000<br>රු. 2,39,84,00,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,30,00,00,000<br>රු. 2,26,40,00,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 60,00,00,000<br>රු. 80,00,00,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 15,00,00,000<br>රු. 1,49,00,00,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.05.16 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*17.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙත පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

මෙම නියමයන් වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි.

## උපලේඛනය

2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2007 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

| අනුක්‍රමික අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | විෂය අංකය | ii රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | iii රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළයුතු ලැබීම්වල අවම සීමාව | | iv රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| 1. | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | 1,225,000,000 | 1,145,000,000 | 698,160,000 | 663,160,000 | 3,150,000,000 | 2,918,000,000 | 1 |
| 2. | ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා | 10301 | 42,000,000 | 122,000,000 | 17,880,000 | 52,880,000 | 150,000,000 | 390,000,000 | 2 |
| 3. | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 25401 | - | - | - | - | 70,000,000 | 135,000,000 | 5 |
| 4. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය | 26401 | - | - | 15,720,000 | 14,000,000 | - | - | 6 |
| 5. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28501 | - | - | 97,320,000 | 86,000,000 | - | - | 7 |
| 6. | ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යවරයා | 15501 | - | - | 6,120,000 | 1,500,000 | - | - | 8 |
| 7. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 28301 | - | - | 28,920,000 | 23,100,000 | - | - | 9 |
| 8. | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා | 15301 | - | - | 840,000 | 5,600,000 | 14,000,000 | 25,962,000 | 10 |
| 9. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28901 | - | - | 13,560,000 | 13,200,000 | - | - | 11 |
| 10. | අධ්‍යාපන අමාත්‍යවරයා | 12601 | - | - | 516,000,000 | 475,000,000 | - | - | 12 |
| 11. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල | 26101 | - | - | 44,520,000 | 33,000,000 | - | - | 14 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 12. | ශ්‍රී ලංකා යුද හමුදාව | 22201 | - | - | 921,000,000 | 800,000,000 | - | - | 15 |
| 13. | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 30601 | - | - | - | - | 1,765,000,000 | 1,865,000,000 | 16 |
| 14. | මැනුම් දෙපාර්තමේන්තුව | 28801 | - | - | 78,120,000 | 72,000,000 | - | - | 17 |
| 15. | තරුණ කටයුතු අමාත්‍යවරයා | 15601 | - | - | - | - | 6,000,000 | 18,000,000 | 18 |
| 16. | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | - | - | 663,160,000 | 600,000,000 | - | - | 19 |
| 17. | ස්වදේශ කටයුතු අමාත්‍යවරයා | 14701 | - | - | - | - | 8,000,000 | 12,000,000 | 20 |
| 18. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර | 27401 | - | - | 31,920,000 | 25,000,000 | - | - | 21 |
| 19. | ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යවරයා | 13101 | - | - | 1,000,000 | 200,000 | - | - | 22 |
| 20. | ශ්‍රී ලංකා නාවික හමුදාව | 22301 | - | - | 208,920,000 | 150,000,000 | - | - | 23 |
| 21. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර | 27001 | - | - | - | - | 65,000,000 | 129,000,000 | 24 |
| 22. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර | 26201 | - | - | 30,780,000 | 29,000,000 | - | - | 25 |
| 23. | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 30001 | - | - | 8,400,000 | 7,000,000 | - | - | 27 |
| 24. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 22401 | - | - | 235,560,000 | 220,000,000 | - | - | 28 |
| 25. | වෙළෙඳ තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 24401 | - | - | - | - | 4,000,000 | 6,500,000 | 29 |
| 26. | ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන අමාත්‍යවරයා | 15901 | - | - | - | - | 50,000,000 | 65,000,000 | 30 |
| 27. | පොල් සංවර්ධන අමාත්‍යවරයා | 14101 | - | - | 840,000 | 500,000 | - | - | 31 |
| 28. | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 32001 | - | - | 192,000 | 96,000 | - | - | 32 |

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය,

2008.05.09 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*18.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,—පරිපූරක මුදල — ශීර්ෂය 160,— වැඩසටහන 02,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළහැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් දහඅට කෝටි අසූ ලක්ෂයකට(රු.188,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය 160 — | පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය | | |
| වැඩ සටහන 02 — | සංවර්ධන ක්‍රියාකාරකම් | | |
| ව්‍යාපෘතිය 3(24) — | වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය | | |
| | පුනරාවර්තන වියදම් | රු. | — |
| | මූලධන වියදම් | රු. | 188,000,000 |
| | මුළු වියදම | රු. | 188,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූනි මස 05 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*19.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,—පරිපූරක මුදල — ශීර්ෂය 160,— වැඩසටහන 01,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළහැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එකසිය තිහකට (රු. 130,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය 160 — | පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය | | |
| වැඩ සටහන 01 — | මෙහෙයුම් | | |
| ව්‍යාපෘතිය 02 — | පරිපාලනමය සහ ආයතනික කටයුතු | | |
| වැය විෂය 2104 — | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | |
| | පුනරාවර්තන වියදම් | රු. | — |
| | මූලධන වියදම් | රු. | 12,700,000 |

| | | | |
|---|---|---|---|
| | මුළු වියදම | රු. | 12,700,000 |
| වැය විෂය 2105 — | ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම් | | |
| | පුනරාවර්තන වියදම් | රු. | — |
| | මූලධන වියදම් | රු. | 117,300,000 |
| | මුළු වියදම | රු. | 117,300,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූනි මස 20 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රුපියල් 188,000,000.

*20.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*21.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*23.

පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.

සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*25.

චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*26.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*27.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*28.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*29.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*30.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*31.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*32.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*33.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2008 ජනවාරි මස 09 වැනි දින 1531/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.03.04 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*34.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 වැනි දින අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද “ 2008 අංක 01 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග” අනුමත කළ යුතු ය.

*35.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වන වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 වැනි දින අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*36.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන

ලදුව, 2007 අප්‍රේල් මස 25 වැනි දින අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*37.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— කොන්සියුලර් කර්තව්‍ය පනත යටතේ නිවේදනය,— 1981 අංක 4 දරන කොන්සියුලර් කර්තව්‍ය පනතේ 8 වැනි වගන්තිය යටතේ කොන්සියුලර් සේවා සඳහා අය කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2007 ජූනි මස 11 වැනි දින හා අංක 1501/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008. 02. 05 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*38.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*39.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධූරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*40.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය හා දීමනාව, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*41.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*42.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 80,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. 12,000.00 | මාසික |

එකතුව රු. 77,000.00

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනාව සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*43.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14,400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*44.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව 2004,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2006. 07. 21 වන දින ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2004 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(නිවාස සහ ඉදිකිරීම් පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

*45.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව 2005,— 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය යටතේ 2006.11.24 වන දින ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ 2005 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

46.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

47.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

48.

මහවැලි සංස්කෘතික පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

49.

රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0411/'08

1.

ගරු පියසිරි විජේනායක මහතා,—සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට, 2004, 2005 හා 2006 වසරවල හෙදියන්, අතුරු වෛද්‍ය සේවා නිලධාරීන්, කණිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයින් හා වාට්ටු ලිපිකරුවන් බඳවා ගෙන තිබේද;

(ii) එම බඳවා ගැනීම් ඉහත එක් එක් වසර වලට අනුව වෙන් වෙන්ව කොපමණද;

(iii) වාට්ටු ලිපිකරු තනතුරට 2004, 2005 හා 2006 වසරවල බඳවාගත් පුද්ගලයන්ගේ ස්ථිර පදිංචිය කවර දිස්ත්‍රික්කවලද;

(iv) එම පුද්ගලයින් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ඔවුන්ගේ ලිපිනයන් හා රාජකාරී ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) කණිෂ්ඨ කාර්ය මණ්ඩලවලට 2004, 2005 හා 2006 වසරවල බඳවා ගැනීම් සිදුකළේ කවර තනතුරු සඳහාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම තනතුරු ස්ථිරද, තාවකාලිකද, අනියම්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) එම බඳවාගත් අයගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, පදිංචි ලිපිනයන් හා වත්මන් රාජකාරී ලිපිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) (i) ඉහත බඳවා ගැනීම් සඳහා විධිමත් බඳවා ගැනීමේ පටිපාටිය අනුගමනය කර තිබේද; සහ

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?